## 51 – එළිය ඔබ මගේ

එළිය ඔබ මගේ මගෙ පිළිසරණේ
කාට බියේ සිටිම් ද මම් සමිඳුණේ
මගේ ජීවිතේ බලකොටුව ඔබේ
එබී හිඳිම් කා ඉදිරියේ හමි සඳේ

මට හතුරුවැ කඳවුරු බැඳ සිටියත් හමුදා
නැ සැලෙන්නේ හදවත මගෙ බියෙන් මිරිකිලා
යුද සේනා නැගැ සිටිතත් මා තැති ගන්වා
ඇදැහිලි සිත මගෙ කොහෙත්මැ නොයයි පිරිහිලා

අයැදිම් මම් එක වරයක් ඔබෙන් සමිඳුණේ
එය මැ පතා සුසුම් හෙලම් හිම්පා සඳුණේ
අවසර මට දෙන්නැ මගේ ජීවිත කාලේ
සියලු දවස් ගෙවා ඉන්න ඔබේ නිවහනේ

සොයනෙම් මම් මුහුණ ඔබේ අනේ සමිඳුණේ
ඔබේ මුහුණ මගෙන් අනේ සඟව නොගන්නේ
උදහස පා ඔබේ ගැත්ත පිටු නොදකින්නේ
කවදාටත් ඔබයි මගේ පිළිසරණ වුණේ

අත්හැරැ මා දමනු එපා පිළිකෙව් කැරැලා
අනේන දෙවියනේ ඔබ මගෙ ගැලැවුම් කරුවා
පියා මගේ අම්මා හෝ එපා කළත් මා
සමිඳුනි ඔබ නැ ඉන්නේ බාර නොගෙනැ මා

සමිඳුන් ගුණ කඳ දයාව දකිම් සහතිකේ
දිවමන් ජනතා ඉන්නා රටේ ඔබැ සූරේ
පතා සිටිම් එකක් හිතින් දිරි වඩා හිතේ
නොවක් සිතින් අදහ සිටිව් හිමි සඳුන් කෙරේ